# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුස්සන් බඳවා ගැනීමට අයදුම්පත් 2019.02.05 දින දක්වා භාරගනු ලැබේ.

## සංගීත පීඨය

**තනතුර :කථීකාචාර්ය (ආධුනික), කථීකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථීකාචාර්ය (II/I ශ්‍රේණිය)**

### උත්තර භාරතීය සංගීත අධ්‍යයනාංශය

**විෂය : 1. උත්තර භාරතීය ශාස්ත්‍රීය වාදනය (සිතාර්)**

**විශේෂ කරුණු :**
උත්තර භාරතීය ශාස්ත්‍රීය සිතාර් වාදන විෂයයේ විශේෂ ප්‍රයෝගික හැකියාව හා න්‍යායාත්මක අවබෝධය අපේක්ෂා කෙරේ.

**විෂය : 2. උත්තර භාරතීය ශාස්ත්‍රීය වාදනය (එස්රාජ්)**

**විශේෂ කරුණු :**
උත්තර භාරතීය ශාස්ත්‍රීය එස්රාජ් වාදන විෂයයේ විශේෂ ප්‍රයෝගික හැකියාව හා න්‍යායාත්මක අවබෝධය අපේක්ෂා කෙරේ.

**විෂය : 3. උත්තර භාරතීය ශාස්ත්‍රීය වාදනය (බටනලා)**

**විශේෂ කරුණු :**
උත්තර භාරතීය ශාස්ත්‍රීය බටනලා වාදන විෂයයේ විශේෂ ප්‍රයෝගික හැකියාව හා න්‍යායාත්මක අවබෝධය අපේක්ෂා කෙරේ.

**විෂය : 4. උත්තර භාරතීය ශාස්ත්‍රීය වාදනය (මෝහන් වීනා සහ බොක්ස් ගිටාර්)**

**විශේෂ කරුණු :**
උත්තර භාරතීය ශාස්ත්‍රීය මෝහන් වීනා සහ බොක්ස් ගිටාර් වාදන විෂයයේ විශේෂ ප්‍රයෝගික හැකියාව හා න්‍යායාත්මක අවබෝධය අපේක්ෂා කෙරේ.

## මානවවංශ සංගීත විද්‍යා අධ්‍යයනාංශය

**විෂය : මානවවංශ සංගීත විද්‍යාව**

**විශේෂ කරුණු :**
දේශීය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වය සහ දේශීය බෙර වාදනය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම අපේක්ෂා කෙරේ.

## දක්ෂිණ භාරතීය සංගීත අධ්‍යයනාංශය

**විෂය : කර්ණාටක සංගීතය - ගායනය**

**විශේෂ කරුණු :**
ජාත්‍යන්තර සහ ජාතික මට්ටමේ ප්‍රාසාංගික ඇගයීම් ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

## බටහිර සංගීත අධ්‍යයනාංශය

**විෂය : 1. බටහිර ශාස්ත්‍රීය සංගීතය වාදනය (පියානෝ)**

**විශේෂ කරුණු :**
පියානෝ වාදනය පිළිබඳව විෂය ප්‍රවීණත්වයට අමතරව බටහිර සංගීත සිද්ධාන්ත, බටහිර සංගීත ඉතිහාසය ඉගැන්වීම පිළිබඳ නිපුණතා ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**විෂය : 2. බටහිර ශාස්ත්‍රීය සංගීතය ගායනය**

**විශේෂ කරුණු :**
බටහිර ශාස්ත්‍රීය සංගීතය ගායනය පිළිබඳව විෂය ප්‍රවීණත්වයට අමතරව පියානෝ වාදනය සම්බන්ධයෙන් ප්‍රවීණතාවය ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**විෂය : 3. බටහිර ශාස්ත්‍රීය සංගීතය වාදනය (සැක්සෆෝන්)**

**විශේෂ කරුණු :**
බටහිර ශාස්ත්‍රීය සංගීතය - සැක්සෆෝන් වාදනය පිළිබඳව විෂය ප්‍රවීණත්වයට අමතරව වෙනත් බටහිර සුසර වාද්‍ය වාදනය හා ඒ පිළිබඳ ඉගැන්වීමට ඇති හැකියාව කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

## සංගීත විද්‍යා අධ්‍යයනාංශය

**විෂය : සංගීත විද්‍යාව**

**විශේෂ කරුණු :**
සංගීත විද්‍යාවේ ආනුෂංගික හින්දුස්ථානි සංගීත අධ්‍යයනය සහ සංගීත විද්‍යාවට අදාල සංගීත භාණ්ඩ ව්‍යුහකරණය/ සංගීත පරිණාමය/ සංගීත චිකිත්සාව/ පර්යේෂණ ක්‍රම විද්‍යාව/ තුලනාත්මක සංගීත අධ්‍යයනය යන විෂය ක්ෂේත්‍ර කිහිපයක් ඉගැන්වීමේ හැකියාව ඇති අපේක්ෂකයින් සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

## ව්‍යවහාරික සංගීත සහ ජනසන්නිවේදන අධ්‍යයනාංශය

**විෂය : 1. ප්‍රායෝගික ව්‍යවහාරික සංගීතය සහ නාද තාක්ෂණය**

**විශේෂ කරුණු :**
ප්‍රයෝගික ව්‍යවහාරික සංගීතය සහ නාද තාක්ෂණවේදය යන විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව ප්‍රයෝගික සහ න්‍යායාත්මක දැනුම මෙන්ම සජීව නාද තුලනය පිළිබඳ හැකියාව සහ ජාතික සහ අන්තර්ජාතික වශයෙන් අදාළ විෂය ක්ෂේත්‍රයන්හි ප්‍රාසාංගික අත්දැකීම් සහ කුසලතා දක්වා ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

**විෂය : 2. ව්‍යවහාරික සංගීතය (තබ්ලා වාදනය) සහ රිද්ම ප්‍රකාශනය**

**විශේෂ කරුණු :**

i. ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීතයෙහි තබ්ලා වාදනය සහ රිද්ම ප්‍රකාශනය පිළිබඳ න්‍යායාත්මක සහ ප්‍රායෝගික හැකියාව විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

ii. ජාත්‍යන්තර සහ ජාතික වශයෙන් අදාළ විෂය ක්ෂේත්‍රයන්හි ඇගයීම්, ප්‍රාසාංගික අත්දැකීම් හා කුසලතා දක්වා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

## දෘශ්‍ය කලා පීඨය

**තනතුර :කථිකාචාර්ය (ආධුනික), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I ශ්‍රේණිය)**

## මූර්ති කලා අධ්‍යයනාංශය

**විෂය : මූර්ති කලා**

**විශේෂ කරුණු :**
මූර්ති කලා විෂය සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ඇඹීම, නෙළීම, විවිධ වාත්තු ක්‍රම හා පෑස්සුම් ක්‍රම පිළිබඳ පළපුරුද්ද හා මූර්ති කලා විෂය පිළිබඳ ලබා ඇති ප්‍රායෝගික අත්දැකීම් විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

## බහු ශික්ෂණාත්මක නිර්මාණ අධ්‍යයනාංශය

**විෂය : බහු ශික්ෂණාත්මක නිර්මාණ සැලසුම්**

**විශේෂ කරුණු :**
පිරිසැලසුම් කලා ඉතිහාසය පිළිබඳ ප්‍රවීණත්වය, සැලසුම් සඳහා වන මානව සාධක සහ ඇඳීම පිළිබඳව න්‍යායාත්මක මෙන්ම ප්‍රායෝගික නිපුණතාව, විෂය මූලික ආකෘති සැලසුම්කරණය සහ පිරිනිර්මාණ ආකෘති විදහාපෑම, සැලසුම් විෂය සඳහා දෘශ්‍ය සන්නිවේදනය යන විෂයයන් පිළිබඳ අවබෝධය විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

## සෙරමික් අධ්‍යයනාංශය

**විෂය : සෙරමික් ඉතිහාසය හා පුරාවිද්‍යාත්මක විශ්ලේෂණය**

**විශේෂ කරුණු :**
සෙරමික් පුරාවස්තු විශ්ලේෂණය හා සෙරමික් පිළිබඳ පර්යේෂණ පරිචයක් තිබිය යුතුය.

## නර්තන හා නාට්‍ය කලා පීඨය

**තනතුර :කථිකාචාර්ය (ආධුනික), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I ශ්‍රේණිය)**

## උඩරට නර්තන අධ්‍යයනාංශය

**විෂය : උඩරට නර්තනය**

**විශේෂ කරුණු :**

උඩරට නර්තනය, වාදනය පිළිබඳ විෂය දැනුමට අමතරව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

i. කොහොඹා යක් කංකාරිය, එහි නාට්‍යමය පෙළපාලි සහ බලි ශාන්තිකර්මය පිළිබඳ ප්‍රායෝගික සහ න්‍යායාත්මක දැනුම

හෝ

ii. සාම්ප්‍රදායික වාදනය හා නිර්මාණාත්මක වාදනය පිළිබඳ ප්‍රායෝගික දැනුම

හෝ

iii. දේශීය ජනනැටුම් පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම

හෝ

iv. කඩවර කංකාරිය ශාන්තිකර්මය පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම

හෝ

v. රංගවින්‍යාසය හා නර්තන නිර්මාණකරණය පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම

හෝ

vi. සම්ප්‍රදායික ගායනය හා පන්තේරු නර්තනය පිළබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම

හෝ

vii. ආනුෂංගික කලා පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම

හෝ

viii. උඩරට නර්තනය පිළිබඳ න්‍යායාත්මක දැනුම හා පර්යේෂණ පරිචය

## පහතරට නර්තන අධ්‍යයනාංශය

**විෂය : පහතරට නර්තනය**

**විශේෂ කරුණු :**

පහතරට නර්තනය, වාදනය පිළිබඳ විෂය දැනුමට අමතරව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

i. සන්නියකුම, සූනියම, රටයකුම හා දෙවොල්මඩු පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම
ii. සාම්ප්‍රදායික කෝළම් නාටක පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම
iii. ශාන්තිකර්ම සැරසිලි පිළිබඳ ප්‍රායෝගික කුසලතාව

## ඉන්දියානු හා ආසියානු නර්තන අධ්‍යයනාංශය

**විෂය : 1. කථක් නර්තනය**

**විශේෂ කරුණු :** කථක් නර්තනයට අමතරව දේශීය නර්තන සම්ප්‍රදායන් පිළිබඳ කුසලතාවය

**විෂය : 2. හින්දි භාෂාව**

**විශේෂ කරුණු :** හින්දි භාෂා දැනුමට අමතරව සෞන්දර්ය විෂයයන් පිළිබඳ දැනුම

**නාට්‍ය, මුද්‍රානාට්‍ය හා නූතන නර්තන අධ්‍යයනාංශය**

**විෂයයන් :** **1. නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය**
**2. රූපණය හා අභිරූපණය**

**විශේෂ කරුණු :**

නාට්‍ය රචනය හා අධ්‍යක්ෂණය, රූපණය හා අභිරූපණය පිළිබඳව න්‍යායික සහ ප්‍රායෝගික පරිචයට අමතරව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

i. දේශීය හා විදේශීය නාට්‍ය රචකයින්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ නිර්මාණාත්මක හා තාක්ෂණික භාවිතාවන් හෝ බටහිර සහ ආසියානු රූපණ විධික්‍රම හෝ පිළිබඳ යාවත්කාලීන දැනුම

ii. ශාස්ත්‍රීය පර්යේෂණ ක්‍රමවේදය (Research Methodology) පිළිබඳ දැනුම සහ ව්‍යවහාරික පළපුරුද්ද

iii. Devised Theatre, Dramaturgy, Traditional Performance in New Context, Anthropology of Performance, Digital (Multimedia) Theatre, Critical Theory, Feminist, Theatre, Mask Performance, Physical Theatre, Musical Theatre, Scenography, Applied Theatre යන විෂය ක්ෂේත්‍ර එකක් හෝ කිහිපයක් පිළිබඳ ප්‍රාමාණික දැනුම සහ පර්යේෂණ/ ඉගැන්වීමේ පළපුරුද්ද

**විෂය :** 3. **මුද්‍රානාට්‍ය, දේශීය නර්තනය හා සමකාලීන නර්තනය**

**විශේෂ කරුණු :**

i. බැලේ රංගකලාව සහ පෙරදිග මුද්‍රානාටක ප්‍රවර්ග හෝ සමකාලීන නර්තන ප්‍රවර්ග හෝ පිළිබඳ යාවත්කාලීන දැනුම

හා

ii. ශාස්ත්‍රීය පර්යේෂණ ක්‍රමවේදය (Research Methodology) පිළිබඳ දැනුම සහ ව්‍යවහාරික පළපුරුද්ද

* ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **II** සහ **I** ශ්‍රේණිය සඳහා අනිවාර්ය සුදුසුකමක් වන අතර අනෙක් තනතුරු සඳහා විශේෂ සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

**අධ්‍යයනාංශය - නර්තන, රංගකලා ඉතිහාසය හා සිද්ධාන්ත අධ්‍යයනාංශය**

**විෂය : 1. තිර රචනය හා අධ්‍යක්ෂණය (සිනමා හා රූපවාහිනී මාධ්‍ය සඳහා)**

**විශේෂ කරුණු :**

තිර රචනය හා අධ්‍යක්ෂණය, නිෂ්පාදන සැලසුම්කරණය, සිනමා අධ්‍යක්ෂණය, ඩිජිටල් සිනමා නිෂ්පාදනය රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදනය හා අධ්‍යක්ෂණය යන විෂය ඒකක පිළිබඳ ප්‍රවීණතාවය

**විෂය : 2. කැමරාකරණය හා ආලෝකකරණය (සිනමා හා රූපවාහිනී මාධ්‍ය සඳහා)**

**විශේෂ කරුණු :**

වීඩියෝ කැමරාකරණය හා ආලෝකකරණය, සිනමා කැමරාකරණය හා ආලෝකකරණය, සිනමා මාධ්‍ය හා රූපවාහිනී මාධ්‍යය සඳහා නර්තන වින්‍යාස සැලසුම්කරණය, වීඩියෝ නර්තන නිෂ්පාදනය පිළිබඳ විෂය ප්‍රවීණතාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**විෂය : 3. කලා අධ්‍යක්ෂණය හා ඇඳුම් පැළඳුම් නිර්මාණය (සිනමා හා රූපවාහිනී මාධ්‍ය සඳහා)**

**විශේෂ කරුණු :**

i. බහු ශික්ෂණ අධ්‍යයන උපාධිය සහිත පරිගණක මෘදුකාංග ආශ්‍රිත සැලසුම්කරණය, ජ්‍යාමිතික ඇඳීම් හා මූලික ආකෘති, ශිල්පකලා සංවර්ධනය, සැරසිලි කලා මූලධර්ම, අමුද්‍රව්‍ය සහ පිරිසැකසුම් විධි, රෙදිපිළි හා ඇඟළුම් කලා විෂය ඒකක පිළිබඳ ප්‍රවීණතාව විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

ii. සිනමා හෝ රූපවාහිනි මාධ්‍යයන්හි කලා අධ්‍යක්ෂණය හා ඇඳුම් පැළඳුම් නිර්මාණය සඳහා ජාත්‍යන්තර හෝ ජාතික ඇගයීම් හෝ සම්මාන ලබා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

**විෂය : 4. ජනශ්‍රැති, ජනකලා අධ්‍යයනය හා ජනසන්නිවේදනය**

**විශේෂ කරුණු :**

i. ජනශ්‍රැති අධ්‍යයනය, ප්‍රාසංගික කලා අධ්‍යයනය, සන්නිවේදන සිද්ධාන්ත, සන්නිවේදන මාධ්‍ය සඳහා නිර්මාණාත්මක චින්තනය හා ලේඛනය, ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණකරණය යන විෂය ප්‍රවීනතාවය මෙන්ම සහ සංස්කෘතික සංරක්ෂණය සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය සැලසුම්කරණය, විද්යුත් හා මුද්‍රිත මාධ්‍ය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීයමය පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

ii. ඉහත විෂය ක්ෂේත්‍ර සඳහා ජාත්‍යන්තර හෝ ජාතික ඇගයීම් හෝ සම්මාන ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

## බහු ශික්ෂණ අධ්‍යයන මධ්‍යස්ථානය (Centre for Multi-Disciplinary Studies)

**තනතුර :කථිකාචාර්ය (ආධුනික), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I ශ්‍රේණිය)**

**විෂය : 1. සන්නිවේදන අධ්‍යයනය**

**විශේෂ කරුණු :**

සිනමාකරණ අධ්‍යයනය, ජන මාධ්‍ය, දෘශ්‍ය සන්නිවේදනය සහ සංඥාර්ථවේදය, සන්නිවේදන පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ දැනුම

**විෂය : 2. හින්දි භාෂාව**

**විශේෂ කරුණු :**

i. ඉන්දියානු සංගීත සහ නර්තනය සඳහා අදාළ වන භාෂාමය කුසලතාවය

ii. ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II සහ I ශ්‍රේණිය සඳහා අනිවාර්ය සුදුසුකමක් වන අතර අනෙක් තනතුරු සඳහා විශේෂ සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

iii. වාග් විද්‍යාව, සංගීතය පිළිබඳ ප්‍රවීණත්වය සහ වෙනත් භාෂා පිළිබඳ ප්‍රවීණත්වය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**විෂයය : 3. ඉතිහාසය, දර්ශනය සහ සමකාලීන විචාර න්‍යාය**

**විශේෂ කරුණු :**

i. ඉතිහාස අධ්‍යයනය, දර්ශනය සහ සමකාලීන විචාර න්‍යාය පිළිබඳ ප්‍රවීණත්වය

ii. ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II සහ I ශ්‍රේණිය සඳහා අනිවාර්ය සුදුසුකමක් වන අතර අනෙක් තනතුරු සඳහා විශේෂ සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

**කථිකාචාර්ය (ආධුනික) තනතුරට අදාළ මූලික සුදුසුකම් හා පළපුරුද්ද**

(1) අදාළ විෂයයෙන් ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) ගෞරව සාමාර්ථයක් සහිතව විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

(2) අදාළ විෂයයෙන් දෙවන පෙළ (පහළ) ගෞරව සාමාර්ථයක් සහිතව විශේෂ උපාධියක් ලබා තිබීම.

හෝ

(3) a) ගෞරව සාමාර්ථයක් රහිතව අදාළ විෂයයෙන් ලබාගත් විශේෂ උපාධියක් හෝ අවම වශයෙන් දෙවන පෙළ සාමාර්ථයක් සහිතව වෙනත් උපාධියක් ලබා තිබීම.

සහ

b) (I) අදාළ විෂයයෙන් ලබා ගත් දර්ශනසූරී උපාධියක්

හෝ

(II) අදාළ විෂයයෙන් ලබා ගත් පර්යේෂණ සහිත පූර්ණ කාලීන අවම වශයෙන් මාස 24 (හෝ සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) ශාස්ත්‍රපති උපාධියක්

හෝ

(III) අදාළ විෂයයෙන් ලබා ගත් පූර්ණ කාලීන අවම වශයෙන් මාස 18 ක කාලසීමාවකින් යුත්, සම්භාර* 15 කට නොඅඩු පර්යේෂණයක් සහිත අවම වශයෙන් සම්භාර 60ක ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම

හෝ

(4) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් අධ්‍යයන හෝ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

**සටහන**

ඉහත අංක (2) සහ (3) යටතේ අයදුම් කරන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ අංක (1) යටතේ සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් නොමැති නම් හෝ තේරීම් මණ්ඩලය විසින් එම අයදුම්කරුවන් බඳවා ගැනීමට නුසුදුසු යැයි තීරණය කරනු ලබන අවස්ථාවකදී පමණි. එවැනි අයදුම්කරුවන් බඳවා ගැනීම විශ්විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය මත සිදුකෙරේ.

**කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුරට අදාළ මූලික සුදුසුකම් හා පළපුරුද්ද**

(1) ඉහත දක්වා ඇති පළමු හෝ දෙවන කාණ්ඩයට (1 සහ 2) යටතේ කථිකාචාර්ය (ආධුනික) තනතුරට අදාළ සියලු අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම.

සහ

(2) අදාළ විෂයයෙන් ලබා ගත් දර්ශනසූරී උපාධියක් හෝ අදාළ විෂයයෙන් ලබා ගත් පර්යේෂණ සහිත පූර්ණ කාලීන අවම වශයෙන් මාස 24 (හෝ සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) ශාස්ත්‍රපති උපාධියක් හෝ අදාළ විෂයයෙන් ලබා ගත් පූර්ණ කාලීන අවම වශයෙන් මාස 18 ක කාලසීමාවකින් යුත්, සම්භාර* 15 කට නොඅඩු පර්යේෂණයක් සහිත අවම වශයෙන් සම්භාර 60 ක ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම. **(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට අදාළ සුදුසුකම් යටතේ දක්වා ඇති පරිදි අදාළ පළපුරුද්ද වසර 06 කට නොඅඩු විය යුතුය.)**

**<u>සටහන</u>**

(a) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තුන්වන කාණ්ඩය යටතේ කථිකාචාර්ය (ආධුනික) තනතුරට සුදුසුකම් ලබන සහ අදාළ විෂයයෙන් දර්ශනසූරී උපාධියක් ලබා ඇති එහෙත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) තනතුරට අදාළ සුදුසුකම් යටතේ දක්වා ඇති පරිදි වසර හයක (06) ක පළපුරුද්දක් නොමැති අයදුම්කරුවන් ඉහත අංක (2) හි සඳහන් කොන්දේසියෙන් නිදහස් කළ හැකිය.

(b) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 හි තුන්වන කාණ්ඩය යටතේ කථිකාචාර්ය (ආධුනික) තනතුරට සුදුසුකම් ලබන සහ අදාළ විෂයයෙන් ඉහත 2 (III) හි සඳහන් සුදුසුකම් සපුරා ඇති එහෙත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) තනතුරට අදාළ සුදුසුකම් යටතේ දක්වා ඇති පරිදි වසර හයක (06) ක පළපුරුද්දක් නොමැති අයදුම්කරුවන් සහාය මහාචාර්ය/ මහාචාර්ය තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටියේ 2 කොටස සහ 3.1 උප කොටසෙහි පර්යේෂණ සහ දැනුම බෙදාහැරීම විෂය පථයන් සඳහා ලකුණු 15 ක් උපයා ගැනීමෙන් අනතුරුව ඉහත අංක (2) හි සඳහන් කොන්දේසියෙන් නිදහස් කළ හැකිය.

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( II ශ්‍රේණිය) තනතුරට අදාළ මූලික සුදුසුකම් හා පළපුරුද්ද**

(1) ඉහත දක්වා ඇති කථිකාචාර්ය (ආධුනික) තනතුරට අදාළ සියලු අධ්‍යාපන සුදුසුකම් ලබා තිබීම.

සහ

(2) (I) අදාළ විෂයයෙන් ලබා ගත් දර්ශනසූරී උපාධියක්

හෝ

(II) අදාළ විෂයයෙන් ලබා ගත් පර්යේෂණ සහිත පූර්ණ කාලීන අවම වශයෙන් මාස 24 (හෝ සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) ශාස්ත්‍රපති උපාධියක්

හෝ

(III) අදාළ විෂයයෙන් ලබා ගත් පූර්ණ කාලීන අවම වශයෙන් මාස 18 ක කාලසීමාවකින් යුත්, සම්භාර* 15 කට නොඅඩු පර්යේෂණයක් සහිත අවම වශයෙන් සම්භාර 60 ක ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම

හෝ

(3) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් අධ්‍යයන හෝ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

සහ

(4) පහත සඳහන් එක් කරුණකින් හෝ වැඩි ගණනකින් අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්දක් තිබීම

i) විශ්වවිද්‍යාල මට්ටමේ ඉගැන්වීම්
ii) වෘත්තීය පළපුරුද්ද
iii) පිළිගත් ආයතනයක පර්යේෂණ කටයුතු කිරීම
iv) ඉහත අංක (2) සඳහන් සුදුසුකම් ලබාගැනීම සඳහා කර ඇති පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ( I ශ්‍රේණිය) තනතුරට අදාළ මූලික සුදුසුකම් හා පළපුරුද්ද**

(1) ඉහත දක්වා ඇති කථිකාචාර්ය (ආධුනික) තනතුරට අදාළ සියලු අධ්‍යාපන සුදුසුකම් තිබීම.

සහ

(2) (I) අදාළ විෂයයෙන් ලබා ගත් දර්ශනසූරී උපාධියක්

හෝ

(II) අදාළ විෂයයෙන් ලබා ගත් පර්යේෂණ සහිත පූර්ණ කාලීන අවම වශයෙන් මාස 24 (හෝ සමාන අර්ධ කාලීන අධ්‍යයන පාඨමාලාවක්) ශාස්ත්‍රපති උපාධියක්

හෝ

(III) අදාළ විෂයයෙන් ලබා ගත් පූර්ණ කාලීන අවම වශයෙන් මාස 18 ක කාලසීමාවකින් යුත්, සම්භාර* 15 කට නොඅඩු පර්යේෂණයක් සහිත අවම වශයෙන් සම්භාර 60 ක ශාස්ත්‍රපති උපාධියක් ලබා තිබීම

හෝ

(3) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නිර්දේශය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන වෙනත් අධ්‍යයන හෝ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් හෝ වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.

සහ

(4) පහත සඳහන් එක් කරුණකින් හෝ වැඩි ගණනකින් අවම වශයෙන් වසර දොළහක (12) පළපුරුද්දක් තිබීම (අංක 2) හි සඳහන් සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව ලබා ගත් අවම වශයෙන් වසර 06 ක පළපුරුද්ද)

i) විශ්වවිද්‍යාල මට්ටමේ ඉගැන්වීම්
ii) වෘත්තීය පළපුරුද්ද
iii) පිළිගත් ආයතනයක පර්යේෂණ කටයුතු කිරීම
iv) ඉහත අංක (2) සඳහන් සුදුසුකම් ලබාගැනීම සඳහා කර ඇති පශ්චාද් උපාධි අධ්‍යයන කටයුතු

**සටහන**

* එක් එක් පාඨමාලාවට සලකා බැලෙන සම්භාර ඒකකයක් Sri Lanka Qualifications Framework හි 2.2 උප කොටසෙහි දී ඇති සම්භාරය ලෙස නිර්වචනය තුළ විය යුතුය.

i) කථිකාචාර්ය (ආධුනික) තනතුරට බඳවා ගැනීමේදී පළමු හෝ දෙවන කාණ්ඩ යටතේ සලකා බලනු ලබන්නේ වසර 04 ක විශේෂවේදී උපාධිය පමණි.

ii) ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාව ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **II** සහ **I** ශ්‍රේණිය සඳහා අනිවාර්ය සුදුසුකමක් වන අතර අනෙක් තනතුරු සඳහා විශේෂ සුදුසුකමක් ලෙස සලකා බලනු ලැබේ.

අනෙකුත් විස්තර **"අයදුම්කරුවන් සඳහා උපදෙස්"** යටතේ දක්වා ඇත.

## තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය (Information Technology Centre)

තනතුරු :

### 1. පරිගණක වැඩ සටහන් ක්‍රම සම්පාදක සහ පද්ධති විශ්ලේෂක (II ශ්‍රේණිය) (Programmer Cum System Analyst) Grade II

**විශේෂ කරුණු** : Multi Media Applications, Web Development and Computer Programming පිළිබඳ දැනුම

**තනතුරට අදාළ මූලික සුදුසුකම් සහ පළපුරුද්ද**

(I). පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු හෝ දෙවන පෙළ සාමර්ථයක් සහිතව විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම.

**හෝ**

(II). (a) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සාමර්ථයක් සහිතව විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා ඇති විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම

**සහ**

(b) පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(III).(a) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාර්ථයක් සහිතව පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා ඇති විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. (පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා නොමැති)

**සහ**

(b) පරිගණක ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(IV). පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධියක් (පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා නොමැති) ලබා තිබීම.

**සහ**

පරිගණක ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(V). ඕනෑම උපාධියක්

**සහ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව/ පරිගණක තාක්‍ෂණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**හෝ**

(VI). පරිගණක වැඩසටහන් සම්පාදකයෙකු වශයෙන් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

## 2. උපදේශක (පරිගණක තාක්ෂණය පිළිබඳ) II ශ්‍රේණිය
## Instructor (Computer Technology) Grade II

**විශේෂ කරුණු :** Multi media Applications, Web Development and Computer Programming පිළිබඳ දැනුම

**තනතුරට අදාළ මූලික සුදුසුකම් සහ පළපුරුද්ද**

ඉහත පරිගණක වැඩ සටහන් ක්‍රම සම්පාදක සහ පද්ධති විශ්ලේෂක (II ශ්‍රේණිය) (Programmer Cum System Analyst Grade II) තනතුරට සඳහන් කර ඇති සුදුසුකම් සහ පළපුරුද්ද යටතේ අංක (VI) හැර අනෙකුත් සියලු සුදුසුකම් සහ පළපුරුද්ද මෙම තනතුර සඳහා අදාළ වේ.

## පුස්තකාලය

## තනතුර :
## සහකාර පරිගණකජාල කළමනාකරු (II ශ්‍රේණිය)
## Assistant Network Manager (Grade II)

**විශේෂ කරුණු** :
Working experience in Linux environment with open source software would be an added qualification.

**තනතුරට අදාළ මූලික සුදුසුකම් සහ පළපුරුද්ද**

(I). පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පෙළ සාමර්ථයක් සහිතව විද්‍යාවේදී (විශේෂ)උපාධියක් ලබා තිබීම.

**හෝ**

(II). (a) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සාමර්ථයක් සහිතව විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම

**<u>සහ</u>**

(b) පරිගණක/ ජාලකරණය යන ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් ලබාතිබීම.

**හෝ**

(III).(a) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාර්ථයක් සහිතව පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබා තිබීම. (පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා නොමැති)

**<u>සහ</u>**

(b) පරිගණක/ ජාලකරණය යන ක්ෂේත්‍රයෙන් වසර දෙකක පළපුරුද්දක් ලබාතිබීම.

**<u>හෝ</u>**

(IV). පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සාමාර්ථයක් සහිතව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් (පරිගණක විද්‍යාව විෂයයක් වශයෙන් හදාරා නොමැති)

**සහ**

පරිගණක/ ජාලකරණය යන ක්ෂේත්‍රයෙන් වසර තුනක පළපුරුද්දක් ලබාතිබීම.

**<u>හෝ</u>**

(V). ඕනෑම උපාධියක්

**සහ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව/ පරිගණක තාක්‍ෂණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

පරිගණක/ ජාලකරණය වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**<u>හෝ</u>**

(VI). පරිගණක වැඩසටහන් සම්පාදකයෙකු වශයෙන් විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ වසර 15 ක පළපුරුද්දක් තිබීම.

## වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (Career Guidance Unit)

## තනතුර : වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක

**<u>තනතුරට අදාළ මූලික සුදුසුකම් සහ පළපුරුද්ද</u>**

පිළිගත් විශ්විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ ශිෂ්‍ය කටයුතු පිළිබඳ වසර 04 ක පළපුරුද්දක් තිබීම. (උපදේශන ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාද් උපාධි සුදුසුකම් සහ/ හෝ වෘත්තීය මාර්ගෝපදේශන ක්‍රියාකාරකම් පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.)

## වැටුප් ව්‍යුහයන් :

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 (v) - 2020 වර්ෂයට අදාළව)

| තනතුර | වැටුප් කේතය | 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය | 2019.01.01 දිනට මූලික වැටුප |
|---|---|---|---|
| කථිකාචාර්ය (ආධුනික) | U-AC3(IV) | රු. 54,600 - 10 x 1,335 - 67,950 p.m | රු.49,053/= |
| කථිකාචාර්ය (ස්ථිර නොකළ) | U-AC3(III) | රු. 69,580 - 5 x 1,630 - 77,730 p.m. | රු.62,344/= |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) | U-AC3(II) | රු. 79,360 - 11 x 1,630 - 97,290 p.m. | රු.71,028/= |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) | U-AC 3(I) | රු. 91,310 - 7 x 2,170 - 106,500 p.m. | රු.81,638/= |
| ක්‍රමසම්පාදක සහ පද්ධති විශ්ලේෂක (II ශ්‍රේණිය)<br>උපදේශක (පරිගණක තාක්ෂණය පිළිබඳ) II ශ්‍රේණිය<br>සහකාර පරිගණකජාල කළමනාකරු (II ශ්‍රේණිය) | U-AS 2(II) | රු. 50,625 - 3 x 1,335- 54,630 (EB) 55,965 -14 x1,335 - 74,655 p.m | රු.45,602/= |
| වෘත්තීය මාර්ගෝපදේශන උපදේශක | U-AS 2 (I) | රු.65,310-4x 1,335; 15 x 1,630-95,100p.m. | රු.58,630/= |

මීට අමතරව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

## අයදුම්කරුවන් සඳහා උපදෙස්

1. උක්ත තනතුරු සඳහා වන අයදුම්පත්, අදාළ සුදුසුකම් සහ වෙනත් අදාළ විස්තර රාජකාරී වේලාව තුළදී (පෙ.ව. 8.30 සිට ප.ව.4.00 දක්වා) සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ආයතන අංශයට පැමිණ හෝ රු.15.00 ක් වටිනා මුද්දර ඇලවූ ලිපිනය සහිත 9"x 4" ප්‍රමාණයේ ලිපි කවරයක් 2019.02.01 දිනට ප්‍රථම **"නියෝජ්‍ය ලේඛකාධිකාරී/ අධ්‍යයන ආයතන, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, අංක 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07"** වෙත එවීමෙන් හෝ විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (**www.vpa.ac.lk**) ලබාගත හැකිය.

2. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.02.05 දින හෝ ඊට ප්‍රථම **"නියෝජ්‍ය ලේඛකාධිකාරී/ අධ්‍යයන ආයතන, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, අංක 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07"** යන ලිපිනයට **ලියාපදිංචි** තැපෑලෙන් එවිය යුතුය. **අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර, විෂය සහ අධ්‍යයනාංශය පැහැදිලිව සඳහන් කළ යුතුය.**

3. කථිකාචාර්ය (ආධුනික), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) යන තනතුරු සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන්ගේ උක්ත හැකියාවන් ප්‍රායෝගික පරීක්ෂණයකින් ඇගයීම් කරනු ලැබේ.

4. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සියලු අයදුම්කරුවන් සිය ඉගැන්වීමේ හැකියාව තහවුරු කිරීම සඳහා තේරීම් මණ්ඩලය ඉදිරියේ ප්‍රස්තුතිකරණයක් (Presentation) ඉදිරිපත් කළ යුතුය.

5. දෘශ්‍ය කලා පීඨයේ කථිකාචාර්ය (ආධුනික), කථිකාචාර්ය (ස්ථිර නොකළ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) යන තනතුරු සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් සිය නිර්මාණ කුසලතා ගොනුවක් (Creative Portfolio) සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

6. ක්‍රමසම්පාදක සහ පද්ධති විශ්ලේෂක (II ශ්‍රේණිය), උපදේශක (පරිගණක තාක්ෂණය පිළිබඳ) II ශ්‍රේණිය, සහකාර පරිගණකජාල කළමනාකරු (II ශ්‍රේණිය) යන තනතුරු සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගේ අදාළ විෂයයන් පිළිබඳ දැනුම හා ප්‍රායෝගික හැකියාවන් අභියෝග්‍යතා පරීක්ෂණයක් මඟින් ඇගයීම් කරනු ලැබේ.

7. සියලුම අයදුම්කරුවන් සිය අයදුම්පත්‍රයෙහි සඳහන් කරුණු සනාථ කෙරෙන සේවා සහතික ඇතුළු අදාළ සියලු සහතික පත්‍රවල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතුය. අදාළ සහතික පත්‍රවල සහතික කරන ලද පිටපත් අමුණා නොමැති අයදුම්පත් අසම්පූර්ණ ලෙස සැලකෙන අතර ඇගයීමට භාජනය නොවනු ඇත.

8. විෂයයන් කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් අයදුම්පත් වෙන් වෙන් වශයෙන් විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති ආකෘති පත්‍රය පමණක් භාවිතා කර ඉදිරිපත් කළ යුතු වේ.

9. රාජ්‍ය සේවයේ සහ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධාන මගින් එවිය යුතුය.

10. අදාළ තනතුරු සම්බන්ධයෙන් සුදුසුකම් අනුව කෙටි ලේඛනගත කල (shortlisted) අයදුම්කරුවන් ප්‍රායෝගික, අභියෝග්‍යතා පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

11. ඉහත සඳහන් කරුණු අසම්පූර්ණ, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
2019.01.03